# මුද්‍රිත මාධ්‍ය විශ්ලේෂණය

## තොරතුරු පත්‍රිකාව - සැප්තැම්බර් 2023

## හැඳින්වීම

මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය 2005 වසරේ සිට දිනපතා මුද්‍රිත මාධ්‍ය පිළිබඳව නිරීක්ෂණයක් සිදු කරයි. මෙහිදී සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන මාධ්‍ය තුනෙන් තෝරා ගත් මුද්‍රිත මාධ්‍ය වල සිදුවන මද්‍යසාර,දුම්කොළ, ගංජා, හෙරොයින් සහ වෙනත් මත්ද්‍රව්‍ය සම්බන්ධව පළ වූ පුවත් පිළිබඳව මාසිකව මුද්‍රිත මාධ්‍ය විශ්ලේෂණයක් සකස් කරයි. මෙම මුද්‍රිත මාධ්‍ය විශ්ලේෂණය තුළින් මත්ද්‍රව්‍ය වාර්ථාකරණය පිළිබඳව පවතින වත්මන් ප්‍රවණතා හඳුනා ගැනීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි.

## දිනපතා පුවත්පත්

| සඳුදා සිට සෙනසුරාදා | | ඉරිදා |
|---|---|---|
| 6 | සිංහල | 5 |
| 5 | ඉංග්‍රීසි | 4 |
| 3 | දෙමළ | 3 |

**තවදුරටත් මාධ්‍ය සහ මාධ්‍යවේදීන් මත්ද්‍රවය නිවාරණය සම්බන්ධයෙන් දක්වන ආකල්ප සහ හැසිරීම් හඳුනා ගැනීම මේ හරහා සිදු කරයි. මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය පිළිබඳ හඳුනාගත් පුවත්පත් වාර්ථා පහත පරිදි වර්ග කරයි :**

මත්ද්‍රව්‍ය නිවාරණය - ජනතාවගේ මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය සහ එම කර්මාන්තවල හැසිරීම පිළිබඳ විද්‍යාත්මක දැනුම සංවර්ධනය කරයි.

මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය - මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය සහ ඒවා ආකර්ෂණීය ලෙස හුවා දැක්වීම, එම කර්මාන්තවල ප්‍රතිරූපය නගා සිටුවීම, මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය සාමාන්‍යකරණය සහ ප්‍රවර්ධනය වන ආකාරයට නිවාරණ පණිවුඩ ලබා දීම සිදු කිරීම, මද්‍යසාර මුවාවෙන් ලබා ගන්නා සමාජ වරප්‍රසාද සහ විද්‍යාත්මක නොවන කරුණු සමාජගත කිරීම.

මත්ද්‍රව්‍ය නිවාරණයට අදාළ ධනාත්මක ප්‍රතිපත්ති -මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය  නිවාරණයට අදාල ප්‍රතිපත්තිවලට සහය දක්වයි.


මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනයට අදාළ සෘණාත්මක ප්‍රතිපත්ති - මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනයට අදාල ප්‍රතිපත්තිවලට සහය දක්වයි.

නීතිය ක්‍රියාත්මක කිරීම - මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍යවලට අදාල නීති/රෙගුලාසි උල්ලංඝණය වීමකදී ආදාල බලධාරීන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග වාර්ථාකරණය.


කිසිවකට අදාළ නොමැති - ඉහත සඳහන් කිසිඳු වර්ගීකරණයකට සෘජුව අදාල නොවූව, භාෂාව හෝ රූප මාධ්‍ය භාවිතය තුළින් මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය  වලට ආදාල තොරතුරු වාර්ථා කිරීම සහ ඒවා සාමාන්‍ය කිරීමට උපකාරී වෙයි.

## ප්‍රවර්ධනය, නිවාරණය, ප්‍රතිපත්ති සහ නීතිය බලාත්මක කිරීම අනුව වර්ගීකරණය.

### ඉරිදා





### සඳුදා සිට සෙනසුරාදා




Prevention | Promotion | Policy (Positive) | Policy (Negatve) | Law enforcement


# පුවත්පත් අනුව වර්ගීකරණය

## සඳුදා සිට සෙනසුරාදා ඉංග්‍රීසි පුවත්පත්




සඳුදා සිට සෙනසුරාදා දක්වා ඉංග්‍රීසි පුවත්පත් තුළ මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධ නිවාරණ පුවත් **Ceylon Today** පුවත්පත තුළ වැඩිම ප්‍රමාණයක් දැක්වෙන අතර සමස්ථයක් ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම් සෑම පුවත්පතකම පළ වී තිබුණි. ප්‍රචාරණයන් වැඩි වශයෙන් දැක්වෙන්නෙ **The Island** පුවත්පත තුළයි.


## ඉරිදා ඉංග්‍රීසි පුවත්පත්




ඉරිදා ඉංග්‍රීසි පුවත්පත් තුල මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධ පළ කිරීම් අතුරින් **Sunday Observer** පුවත්පත තුළ නිවාරණය සම්බන්ධ පුවත් 3ක් ද, නීතිය ක්‍රියාත්මක වීම සම්බන්ධව පුවත්පත් සියල්ල තුළම පළ කිරීම් සිදු වී තිබුණි.


Prevention | Promotion | Policy (Positive) | Policy (Negatve) | Law enforcement | n = Number of articles

## සඳුදා සිට සෙනසුරාදා සිංහල පුවත්පත්




සඳුදා සිට සෙනසුරාදා දක්වා සිංහල පුවත්පත් තුළ මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධ පුවත්පල කිරීම් අතරින් සියලුම පුවත්පත්වල නිවාරණය සම්බන්ධව පළ කිරීම් බහුලව පළ වී ඇත. නීතිය ක්‍රියාත්මක වීම් සම්බන්ධ පුවත් විශාල ප්‍රමාණයක් දිනමිණ පුවත්පත තුළ දැක ගත හැකිය.


## ඉරිදා සිංහල පුවත්පත්




ඉරිදා සිංහල පුවත්පත් අතුරින් වැඩිපුරම මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය නිවාරණය සිදු කර ඇත්තේ ඉරිදා දිවයින පුවත්පතයි. ඉරිදා අරුණ පුවත්පත ප්‍රචාරණයන් වැඩිපුරම සිදු කළ පුවත්පත වන අතර පුවත්පත් සමස්ථය අතුරින් නිවාරණය සම්බන්ධ පුවත් බහුලව දැක ගත හැකිය.


Prevention | Promotion | Policy (Positive) | Policy (Negatve) | Law enforcement | n = Number of articles

## සඳුදා සිට සෙනසුරාදා දෙමළ පුවත්පත්




අනෙකුත් පුවත්පත්වලට සාපේක්ෂව මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වැඩිපුරම ප්‍රචාරණය සිදු කර ඇත්තේ තිනාකරන් පුවත්පත (2) වන අතර නීතිය ක්‍රියාත්මක කිරීම පුවත්පත් තුනෙහිම බහුලව දැකගත හැකිය.

## ඉරිදා දෙමළ පුවත්පත්




ඉරිදා තිනක්කුරල් පුවත්පතේ මද්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය ප්‍රචාරණයන් (1) ක් සහ නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පුවත් (3) ක් පළ වී තිබුණි. නිවාරණය සම්බන්ධව ඉරිදා වීරකේසරි පුවත්පතේ එක් පුවතක් පළ වී තිබුණි.

Prevention | Promotion | Policy (Positive) | Policy (Negatve) | Law enforcement | n = Number of articles